**විදුලිබල කර්මාන්තය සඳහා වන පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධන 2022**

**අයක්‍රම ගාස්තු කාල සීමාව**

10. සෑම වසරකම ජනවාරි සහ ජූලි 01 වැනි ස්ථාවර දිනයක් ඉලක්ක කර ගනිමින් විදුලි සැපයුමේ පාරිභෝගික මිල ගණන් සංශෝධනය කිරීම සඳහා අවම වශයෙන් මාස හයකට (ගාස්තු කාල සීමාව ලෙස නම් කළ) වරක් විදුලි සැපයුමේ පිරිවැය සහ මිල සමාලෝචනය කෙරේ. උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ පිරිවැය වැනි පිරිවැය මූලිකාංග ද, ඉහළ උද්ධමනය සහ තෙල් මිලෙහි වෙනස්වීම්, විනිමය අනුපාතය සහ වර්ෂාපතනය මත සිදුවන උත්පාදන පිරිවැය වෙනස්කම් ද වසරකට වරක් සමාලෝචනය කළ යුතු අතර, ගාස්තු කාල සීමාව කෙටි කරන ලෙස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව අමාත්‍යාංශය විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් සහ බලපත්‍රලාභීන්ගෙන් ඉල්ලා සිටිනු ඇත.

11. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සෑම වසරකම අදාළ වර්ෂයේ විදුලි ගාස්තු ක්‍රියාත්මක වීමට නියමිත ස්ථාවර දිනයන් පිළිබඳව වහාම ප්‍රසිද්ධ කළ යුතු වේ. එම දිනයන් 2030 වර්ෂය වන තෙක් ස්ථාවරව පවතිනු ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද කාලසටහනක් මත, බලපත්‍රලාභීන් විසින් එම දිනයන්ට පෙර තම පිරිවැය සහ මිල ගණන් අනුමැතිය සඳහා කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතු වේ.

**සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ සමස්ථ ආදායම් අවශ්‍යතා**

12. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් පෙර ගාස්තු කාල සීමාව අවසන් වී දින 30ක් ඇතුළත විදුලිය මිලදී ගැනීම සඳහා වැයවූ සත්‍ය පිරිවැය සහ ඉදිරි ගාස්තු කාලසීමාව ආරම්භ කිරීමට දින 30 කට පෙර ඇස්තමේන්තුගත විදුලිය මිලදී ගැනීමේ පිරිවැය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගෙන් විදුලිය මිලදී ගැනීමේ පිරිවැය අයදුම්පත ලද දින සිට දින 15ක් ඇතුළත, ප්‍රකාශිත විදුලිය මිලදී ගැනීමේ පිරිවැය සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට අවසර දිය යුතු විදුලිය මිලදී ගැනීමේ පිරිවැය මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තීරණය කිරීම අපේක්ෂා කෙරේ.

13. සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ජාලය නඩත්තු කිරීම සඳහා දරන ලද පිරිවැය සහ පෙර වසරේ පොදු කාර්ය සහ මූල්‍ය පිරිවැය ඇතුළු සේවා සහ ඉදිරි වසර සඳහා ඇස්තමේන්තුගත වියදම් සෑම වසරකම මාර්තු 31 දින වන විට සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ඇත. බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද විදුලිය මිලදී ගැනීමේ පිරිවැය දත්ත සහ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පිරිවැය දත්ත මත පදනම්ව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලිත් වර්ෂය ආරම්භයට මාස 2 කට පෙර එක් එක් බලපත්‍රලාභියාගේ සමස්ථ ආදායම් අවශ්‍යතා තීරණය කරනු ඇත. කෙසේ වෙතත්, ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් පිරිවැය මත පදනම්ව මිල සහ ගාස්තු සංශෝධනය සඳහා විශේෂ අනුමැතියක් අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන්නේ නම්, එවිට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව එවැනි තීරණයක් ක්‍රියාත්මක කිරීමට වහාම පියවර ගත යුතුය.

14. එක් එක් ගාස්තු කාලසීමාව සඳහා එක් එක් සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභියා සම්බන්ධයෙන් වන අවසර ලත් සමස්ත ආදායම් අවශ්‍යතාව තීරණය කිරීම සඳහා සංශෝධිත ක්‍රමවේදයක් 2023 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කර, ප්‍රකාශයට පත් කර, ක්‍රියාත්මක කළ යුතුය. අවසර ලත් ආදායම් හරහා පිරිවැය

භාවිතයේ කාර්යක්ෂමතාව පිළිබිඹුවීම සහතික කරනු පිණිස, සෑම සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත්‍රලාභියෙක් විසින්ම ප්‍රධාන කාර්යසාධක දර්ශක නිර්වචනය කර අධීක්ෂණය කළ යුතු අතර තම ඉලක්ක (අනෙකුත් කලාපීය සහ ජාත්‍යන්තර විදුලි උපයෝගිතා සඳහා යොමු කිරීම් ඇතුළුව), කාර්යක්ෂමතාවය සහ තමන් ලද සාධනීය අත්කරගැනීම්වල ප්‍රගතිශීලී වර්ධනයන් සම්බන්ධයෙන් තොරතුරු එක් එක් ආදායම් අවශ්‍යතා ඉදිරිපත් කිරීමක් සමග ඉදිරිපත් කළ යුතුය.

15. යම් ගාස්තු කාලයක් සඳහා වන සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් පිරිවැය අනුමත අගය ඉක්මවූ අවස්ථාවකදී සාධාරණ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව එවැනි මුදලක් සම්බන්ධයෙන් හානි පූර්ණයක් සිදු කරනු නොලැබේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එක් එක් බලපත්‍රලාභියා විසින් ලබා ගත යුතු අවම කාර්යක්ෂමතා මට්ටම් සැකසීම සඳහා බලපත්‍රලාභීන් සමඟ සාකච්ඡා කර විශේෂඥ ස්වාධීන ආයතනයක් හරහා අධ්‍යයනයක් සිදු කළ යුතු අතර බලපත්‍රලාභියා නියමිත කාර්යක්ෂමතා ප්‍රමිතීන් සපුරා නොමැති නම් සමස්ත ආදායම් අවශ්‍යතාවය නියමිත අවම කාර්යක්ෂමතා මට්ටමින් ගණනය කරනු ලැබේ.

**එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා විදුලි සැපයුම් ගාස්තු සහ පිරිවැය පාදක කරගත් ගාස්තු**

16. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් පාරිභෝගික ගාස්තු ගණනය කිරීමේ ක්‍රමවේදයක් 2023 වර්ෂය අවසානය වන විට හඳුන්වා දිය යුතුය

17. වර්ෂය පුරාවට බාධාවකින් තොරව පාරිභෝගිකයින්හට අඛණ්ඩව විදුලිය සපයනු ලබන බවට වූ උපකල්පනය මත පදනම්ව විදුලිය මිලදී ගැනීමේ මිල ගණන්, පුරෝකථන පාරිභෝගික අංක සහ විකුණුම් ඇතුළුව අනුමත සමස්ත ආදායම් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සෑම ගාස්තු කාලසීමාවක් සඳහාම එක් එක් වර්ගයේ සහ එක් එක් කාණ්ඩවල පාරිභෝගික කාණ්ඩයක් සඳහා විස්තරාත්මක විදුලි සැපයුම් පිරිවැයක් ගණනය කර ඉදිරිපත් කළ යුතුය.

18. විවිධ කාල සීමාවන් තුළ විදුලි පරිභෝජනය වාර්තා කරගත හැකි ස්මාර්ට් මීටර් භාවිතා කරනු ලබන පාරිභෝගිකයන් සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිත ක්‍රමවේදය පදනම් කරගනිමින් හඳුනාගත් කාලවකවානු සඳහා විදුලිය සැපයීමේ පිරිවැය ගණනය කළ යුතුය.

19. එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා ගණනය කරන ලද විදුලිය සැපයුම් පිරිවැය පිළිබිඹු වන මට්ටමකින් පාරිභෝගික මිල ගණන් තීරණය කළ යුතුය. කෙසේවෙතත්, අඩු ආදායම්ලාභී කාණ්ඩ ඉලක්කර ගනිමින් සහනාධාර ගාස්තු තීරණය කිරීමේදී මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගත යුතුය.

20. අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින් සඳහා සමාජීය වශයෙන් පිළිගත හැකි යාවජීව ගාස්තු සම්බන්ධයෙන් සහ සැපයුම් පිරිවැය සහ අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින්ගේ දරා ගත හැකි ගාස්තු ආවරණය කිරීම සඳහා අනෙකුත් පාරිභෝගික කණ්ඩායම් විසින් ලබා දිය යුතු මූල්‍යාධාර සහ ප්‍රතිසහනාධාර ප්‍රමාණය පිළිබඳ තීරණය කිරීමේදී මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබාගත යුතුය. (ප්‍රතිසහනාධාරය, වඩාත් සුදුසු ලෙස ගාස්තු චක්‍ර කිහිපයකදී ක්‍රමක්‍රමයෙන් ඉවත් කළ යුතුය.)

21. අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා විශේෂිත පාරිභෝගික කාණ්ඩයන් විසින් ලබා දිය යුතු ප්‍රතිසහනාධාරය, පිරිවැය පාදක මිල ක්‍රමය පවත්වාගෙන යාම සඳහා සහනාධාර සපයන පාරිභෝගික කාණ්ඩයේ සැපයුම් පිරිවැයෙන් 15% කට සීමා විය යුතුය

22. 2025 වන විට මිණුම්කරණයේ සහ මිලකරණයේ සරළ බව ලබා කර ගැනීම සහ ජාත්‍යන්තරයේ හොදම භාවිතයට පෙළ ගැසීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගාස්තු කොටස් ඒකාබද්ධ කිරීම, ප්‍රමාණයන් අනුව වෙනස් වූ ගෘහස්ත, කර්මාන්ත සහ පොදු අවශ්‍යතා සඳහා වන ගාස්තු ඉවත් කිරීම සහ පැහැදිලිව නිර්වචනය නොවූ පාරිභෝගික කාණ්ඩ ඉවත් කිරීම සඳහා වන ක්‍රියා සැලැස්මක් පළ කළ යුතුය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාරිභෝගික ගාස්තු ක්‍රමවේදය ස්ථාපිත කරනු පිණිස මෙම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමට සහතික විය යුතුය.

23. බැංකු, මූල්‍ය ආයතන, ප්‍රාග්ධන ආයෝජන ආයතන සහ දේපළ වෙළඳාම් ආයතන වැනි වාණිජ ව්‍යවසායන් සඳහා කුමන ආකාරයක හෝ සහනාධාරයක් ලබාදීම අනුමත නොකරන අතර අවම වශයෙන් විදුලිය සැපයීමේ සත්‍ය පිරිවැය හෝ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

**සහනාධාර**

24. අනාගතයේදී විදුලිබල ක්ෂේත්‍රය සඳහා රජයේ සහනාධාර ලබා දෙනු නොලැබේ. කෙසේ වෙතත්, උපයෝගිතා ආයතන විසින් අඩු ආදායම්ලාභී කණ්ඩායම සහ කර්මාන්ත පාරිභෝගිකයින් වෙත පහසුකම් සැලසීමේදී ප්‍රතිසහනාධාර ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය.

25. බිල්පත් කිරීමේ සහ සහනාධාර කළමනාකරණයේ විනිවිදභාවය සහතික කිරීම සඳහා පාරිභෝගිකයාට විදුලිය සැපයීමේ ගාස්තුව, අනුමත ගාස්තු ක්‍රමය තුළ අයකරන සත්‍ය ගාස්තුව සහ පාරිභෝගිකයාට ලබා දෙන සහනාධාරය (හෝ පනවා ඇති අධිභාරය) පිළිබඳව බිල්පතෙහි සඳහන් කිරීම (හෝ විද්‍යුත් බිල්පත් නිකුත් කරන්නේ නම්, විද්‍යුත් මාධ්‍යයක් භාවිතා කරමින් පැහැදිලිව ලබාදීම) 2023 වර්ෂයේ සිට ආරම්භ කළ යුතුය.

26. හෝටල් කර්මාන්තය සඳහා දැනටමත් පනවා ඇති බදු හිලව් කිරීමෙන් හෝටල් කර්මාන්තය සඳහා සහනාධාර ලබාදීමේ හැකියාව සොයා බැලිය යුතුය.

**2023 වර්ෂයේ පළමු අර්ධය සඳහා වන අන්තර්කාලීන විධිවිධාන**

27. සංශෝධිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශය අනුව, 2023 වර්ෂයේ පළමු අර්ධය සඳහා වන මිල සහ ගාස්තු ඇමුණුම 03 පරිදි 2023 ජනවාරි 01 දින සිට ක්‍රියාවට නැංවිය යුතුය.

**වෙළඳපොළ සහ මිලකරණ ප්‍රතිසංස්කරණ**

28. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් (i) විදුලි බෙදාහැරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ බලපත්‍රලාභීන් විසින් විදුලිය බෙදාහැරීමේ පහසුකම සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම (ii) විදුලි බෙදාහැරීම් සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් හට විදුලිය විකිණීම සඳහා කුඩා නිෂ්පාදකයන්ට ඉඩ පහසුකම් ලබාදීම සහ (iii) විදුලි වෙළඳාම සඳහා අවශ්‍ය වෙළඳපොළක් ස්ථාපිත කිරීම ඇතුළු විදුලිබල ක්ෂේත්‍රයේ සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ සඳහා තවදුරටත් අවශ්‍ය පියවරයන් ගනු ලබනු ඇත.

29. ප්‍රතිසංස්කරණය මඟින් 2025 වර්ෂයේ සිට සියලු ආකාරයේ සහනාධාර ලබාදීම නවතා දමනු ලබන අතර, සහනාධාර අවශ්‍ය පාරිභෝගික කණ්ඩායම් සඳහා විදුලිය මිලකරණය සහ බිල්පත්කරණ ක්‍රියාවලියෙන් බැහැරව අවශ්‍ය සහනාධාර ඍජුවම ලබාදීමට කටයුතු කරනු ලැබේ

**කොටස් කිරීම සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ**

30. ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යයන් වෙන් කර ගැනීමේ ක්‍රියාවලිය 2024 වර්ෂයේ මාර්තු මස 31 දින වනවිට සම්පූර්ණ කළ යුතු අතර, විදුලිබල ක්ෂේත්‍රයේ සියලු බලපත්‍රලාභී ආයතනවල මූල්‍ය ස්වාධීනත්වය ස්ථාපිත කළ යුතුය. මේ සඳහා 2023 වර්ෂය සඳහා වන පිරිවැය ගණනයේදී අදාළ බලපත්‍රලාභී ආයතන වෙත සියලු වත්කම් සහ වගකීම් සැපයිය යුතු වේ.

31. විදුලිය උත්පාදනයේ සිට සම්ප්‍රේෂණය දක්වාත් සම්ප්‍රේෂණයේ සිට බෙදාහැරීම දක්වාත් විකුණුම් සඳහා වන වර්තමාන ඉන්වොයිස්පත් සකස් කිරීම 2023 වර්ෂයේ සිට සත්‍ය ගනුදෙනු බවට පරිවර්තනය කළ යුතු වේ. අදාල පාරිභෝගිකයන් වෙත විදුලිය විකිණීමේදී අවසන් පරිභෝජන පාරිභෝගික ගෙවීම් කිරීම සඳහා එක් එක් බලපත්‍රලාභීන් විසින් එකිනෙකට වෙනස් ගිණුම් පවත්වාගෙන යා යුතු වේ.

32. සෑම ස්වාධීන බලපත්‍රලාභියෙකු විසින්ම තම නියාමන ගිණුම් ඉදිරිපත් කළ යුතු අතර 2023 වර්ෂයේ සිට ඔවුන්ගේ ගිණුම් ප්‍රකාශයට පත්කළ යුතු වේ. සෑම බලපත්‍රලාභී ආයතනයකම ප්‍රධාන විධායක නිලධාරියාට එම ආයතනවල මූල්‍ය යහපැවැත්ම පිළිබඳ වගකීම පැවරී තිබේ.